# මහින්ද රාජපක්ෂ මහතා හා ජාතික මතවාද

මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපතිවීමට පෙර ශ්‍රී ල නි පක්ෂය ප්‍රමුඛ එක්සත් ජනතා නිදහස් සංධානයේ ජනාධිපති අපේක්ෂයා ලෙස තේරිය යුතුව තිබිණි. ඒ පහසුවෙන් සිද්ධවුවක් නොවන බව අපි දනිමු. ශ්‍රී ල නි පක්ෂයේ ද සංධානයේ ද එවකට නායිකාව වූයේ චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ය. අනූවේ දශකයේ මුල එතුමිය ලංකාවට කැන්දන් ඒමට මුල් වූ කිහිප දෙනාට අවශ්‍ය ව තිබුණේ ශ්‍රී ල නි පක්ෂයේ ගමන් මග වෙනස්කරවා එයට හිමි කාර්යය නොව වෙනත් කාර්යයක් කරවීමට ය. 1954 පමණ වන විට මෙරට ජාතිකත්වයේ පක්ෂය බවට පත්ව තිබූ ශ්‍රී ල නි පක්ෂය තවත් විජාතික පක්ෂයක් බවට පත්කිරීමට විජාතික බලවේගවලර අවශ්‍ය විය. කුමාරතුංග මහත්මිය බටහිර බලවේග මත පදනම් ව අපහසුවකින් තොරව ම ඒ කළා ය. බටහිර බලවතුන්ගේ අවශ්‍යතාව පරිදි ඔවුන්ගේ ආධාරය ද ඇතිව ශ්‍රී ල නි පක්ෂය සිංහලත්වයට එරෙහිව ඒ නිසා ම ලාංකිකත්වයට එරෙහිව මෙහෙයවී ය. එහි ප්‍රතිඵලය වූයේ අවසානයේ දී රනිල් වික්‍රමසිංහ මහතා අගමැති ලෙස පත්වීම ය.

ආධානග්‍රාහී මාක්ස්වාදීහු අද ද ඒ ජා පක්ෂය හා ශ්‍රී ල නි ප අතර වෙනස ඊනියා පංති පදනම මත පදනම් ව තේරුම්ගැනීමට උත්සාහ කරති. ඔවුන් ඒ පක්ෂ අතර වෙනසක් නොදකින්නේ ඔවුන්ගේ කසිකබල් මාක්ස්වාදයේ අසාර්ථකත්වය පිළිබිඹු කරමිනි. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය පක්ෂයේ නායකත්වය දැරූ යුගයෙහි නම් ශ්‍රී ල නි ප හා ඒ ජා ප අතර වෙනසක් නො වී ය. එහෙත් සාමාන්‍යයෙහ් ඒ පක්ෂ දෙක අතර වෙනසක් ඇති වී තිබෙන්න් ශ්‍රී ල නි පක්ෂ සිංහලත්වයේ පක්ෂය වීමත් ඒ ජා ප විජාතික බලවේගයේ නියෝජිතයකු වීමත් නිසා ය. ජාතිකත්වය අවබෝධ කරගැනීමට අසමත් මාක්ස්වාදයට මේ වෙනස හඳුනාගැනීමට නොහැකිවීම පුදුමයක් නො වේ. මාක්ස්වාදීන්ගේ ඊනියා ජාතික ධනපති පංතිය හා සුළු ධනේශ්වරය පිළිබඳ කතා විකාර බව ඔවුන්ගේ ම වෙනත් ප්‍රකාශවලින් පැහැදිලි වෙයි.

චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ නායකත්වය යටතේ ශ්‍රී ල නි පක්ෂය තමන්ට හිමි කාර්යභාරය අමතක කර අයාලේ ගිය ද අවුරුද්දු හතරකට පෙර පසුගිය ජනාධිපතිවරණය පැවැත්වෙන කාලය වන විට මෙරට ජාතික මතවාද යම් පමණකට ශක්තිමත්ව තහවුරු වී තිබිණි. ඒ පුවත්පත්වලට හා සඟරාවලට පමණක් සීමා වූ එකක් ද නො වී ය. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ජනාධිපතිනිය ව සිටි කාලයේ පටන් ම විශේෂයෙන් ම දෙමළ ජාතිවාදය, බෙදුම්වාදය හා ත්‍රස්තවාදය අරභයා ජාතික මතවාද ජනතාව අතරට නොයෙක් ආකාරයෙන් ගෙන ගොස් තිබිණි. පාද යාත්‍රා, රිය පෙරහැර, ගම් නියම්ගම්වල පවත්වන ලද සම්මන්ත්‍රණ මෙන් ම පසුව ඒ ජා පක්ෂය විසින් ගසාකනු ලැබූව ද සිංහල කොමිසම ද ජාතික මතවාද ජනතාවට ලබාදීමට සමත්විය.

එහි ප්‍රතිඵලය වූයේ මූලික වශයෙන් සිංහලයන් අතර ක්‍රියාත්මක වන විවිධ දේශපාලන පක්ෂ ක්‍රමයෙන් ජාතික මතවාදවලට ඇදී ඒම ය. බොහෝ දේශපාලන පක්ෂ මේ බව නො පිළිගනු ඇත. ඔවුන් කියනු ඇත්තේ ඒ මතවාද තමන් ගොඩනැගූ බව ය. උදාහරණයක් වශයෙන් ගතහොත් තමන් සැමදාමත් කියා සිටියේ ප්‍රභාකරන් හා කොටි ත්‍රස්තවාදීන් පරාජය කළ හැකි බව හා කළ යුතු බව යැයි ඔවුන් අද කියන බව රහසක් නො වේ. එහෙත් ඒ අසත්‍ය බව දැනගැනීමට කළ යුත්තේ පරණ පුවත්පත් කියවීම පමණ ය. ඒ කුමක් වුවත් දේශපාලන පක්ෂ ජාතික මතවාදී ස්ථාවරයන්ට එළඹීම ජාතියේ ජයග්‍රහණයක් විය.

මෙහි දී සඳහන් කළ යුතු වැදගත් කරුණක් වෙයි. සිංහලයන් අතර ජාතිකත්වය නිර්මාණය කෙරෙන්නේ දේශපාලන පක්ෂවලින් හා උඩින් නො වේ. අවුරුදු දහස් ගණනක් තිස්සේ සිංහලයන්ගේ ජාතිකත්වය වෙයි. ඒ මතු කෙරෙන්නේ කාලාම සූත්‍රයෙහි සඳහන් වන වචනයක් යොදා ගැනෙන්නේ නම් විඤ්ඤූන් අතිනි. විඤ්ඤූන් නොවන පඬියන් හා ඕල්කට් බෞද්ධයන් අතින් කාලාම සූත්‍රය විකෘති කෙරී සිංහල බෞද්ධයන් ව්‍යාජ බටහිර විද්‍යාඥයන් කිරීමට තැත්කරනු ලැබුව ද සාමාන්‍ය සිංහල බෞද්ධයෝ බුදුන් වහන්සේ කාලාමයන්ට දේශනා කළ පරිදි විඤ්ඤූන් අනුගමනය කරති. සිංහලයන්ගේ ජාතිකත්වය එසේ දේශපාලන පක්ෂ ඔස්සේ නොව විඤ්ඤූන්ගෙන් මතුවන්නකි. සිංහල බෞද්ධ විඤ්ඤූන් එහි දී කරන්නේ විවිධ හේතුන් නිසා යටපත් වී ඇති ජාතිකත්වය නැවත මතුකර ගැනීම මිස අළුතින් නිර්මාණය කිරීමක් නොවන බව අවධාරණය කළ යුතු ය. සිංහල බෞද්ධ විඤ්ඤූන් ජාතිකත්වය මත පදනම් වී ජාතික මතවාද නිර්මාණය කරනු ඇත. ඔවුන් ජාතිකත්වය පිළිබඳව ද ජාතික මතවාද නිර්මාණය කරනු ඇත. එහෙත්

© Prof. Nalin De Silva

ජාතිකත්වය ඔවුන්ගේ නිර්මාණයක් නො වේ. ලිබරල් පක්ෂයක් ලෙස 1951 දී බිහි වූ ශ්‍රී ල නි පක්ෂය පවා ජාතිකත්වය දෙසට යොමු කෙරුණේ ඒ මතුකළ මෙත්තානන්ද මහතා වැනි පිරිසකගේ නායකත්වයෙන් බව අමතක නොකළ යුතු ය. ඒ මහත්වරු ඕල්කට් බෞද්ධයෝ නො වූහ. .

එහෙත් දෙමළ ජාතිකත්වය එසේ නො වේ. ජනතාව අතර මතුකර ගත හැකි දෙමළ ජාතිකත්වයක් නැත. ඉතිහාසයේ කිසි දිනෙක ලෝකයේ කිසි තැනක දෙමළ ජාතියක් හෝ දෙමළ රාජ්‍යයක් නොතිබි පසුබිමක දෙමල ජාතිකත්වයක් තිබිය නො හැකි ය. ලංකාවේ දෙමළ ජාතිකත්වය ව්‍යාජයක් පමණක් නොව බටහිරයන් විසින් සිංහලත්වය දුර්වල කිරීමට හැකිනම් නැතිකිරීමට උඩින් හා බාහිර ව ඇතිකරනු ලැබුවකි. දෙමළ හින්දු ජාතිකත්වයක් නොව දෙමළ ක්‍රිස්තියානි ජාතිකත්වයක් ඇතිවීමේ පදනම එය වෙයි.

මහින්ද රාජපක්ෂ මහතා ජනාධිපති අපේක්ෂකයා ලෙස තේරුණේ ජාතික මතවාද යම් ප්‍රමාණයක් පිළිගැනීමෙනි. එහි දී ශ්‍රී ල නි ප චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ විජාතික මතවාදවලින් බැහැර වූයේ ඉබ්බා දියට දැම්මා සේ ය. එහෙත් ඉන් කියැවෙන්නේ ශ්‍රී ල නි පක්ෂයේ සියල්ලන් ම ජාතික මතවාද පිළිගත් බව නො වේ. විශේෂයෙන් ම නායකයන් අතර ජාතික මතවාද නොපිළිගන්නෝ අද ද වෙති. මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය නම් කෙරුණේ මහින්ද චින්තන යනුවෙනි. එසේ නම් කෙරී ඇත්තේ ද ඓතිහාසික ව ජාතිකත්වය මත පදනම් වෙමිනි.

මහින්ද රාජපක්ෂ මහතා දෙමළ ත්‍රස්තවාදය පරාජය කිරීමට එළඹුණේ පැහැදිලිව ම ජාතික මතවදවල පදනම් වෙමිනි. එතෙක් ආධිපත්‍යයෙහි පැවති විජාතික මතවාදවලට අනුව ප්‍රභාකරන් හා ඔහුගේ නායකත්වය යටතේ ත්‍රස්තවාදී ක්‍රියාවල නිරත වූ කොටි  අනභිබවනීය වූහ. ජාතික මතවාදවල පිහිටි මහින්ද රාජපක්ෂ මහතා දැනට මාස හයකට පමණ පෙර විශිෂ්ට ජයක් ලැබී ය. ඒ අපේ ඉතිහාසයේ දීප්තිමත් ම මොහොතක් විය. එහි දී ගෝඨාභය රාජපක්ෂ මහතාගේ මෙන් ම අද කුමක් කළ ද තම හමුදා ඉතා විශිෂ්ට කැපවීමකින් මෙහෙය වූ ජෙනරල් සරත් ෆොන්සේකා මහතාගේ කාර්යභාරය ද කිසිසේත් ම අමතක නො කළ යුතු ය. ඒ දීප්තිමත් මොහොත කැළැල් නොකර ඉතිරි කටයුතු ද සම්පූර්ණකර දෙමළ ජාතිවාදය හා දෙමළ බෙදුම්වාදය පරාජය කිරීමට සරත් ෆොන්සේකා මහතා රාජපක්ෂ මහතාට සහාය දිය යුතු ය. තමා කඩේ ඇරීමට තැත්කරන විජාතික බලවේග සමග ෆොන්සේකා මහතාට කළ හැකි ගනු දෙනුවක් නැත.

ජාතික මතවාදවල පිහිටා මහින්ද රාජපක්ෂ මහතා මතට තිත ව්‍යාපෘතිය අරඹා ඇත. එය මුළුමනින් ම සාර්ථක යැයි කිව නොහැකි වුවත් ඒ මහතා නිවැරදි මාවතට පිවිස ඇත. එමෙන් ම පාතාළය මර්දනය කිරීම ද යම් පමණකින් හෝ සාර්ථක වී ඇත. එහෙත් ඒ මාවත්වල තව බොහෝ දුරක් ගමන් කිරීමට ඇත. දෙමළ ත්‍රස්තවාදය පරාජය කිරීම හැරුණු විට මහින්ද රාජපක්ෂ මහතා ජාතික මතවාදවල පිහිටා විශිෂ්ට ජයග්‍රහණ අත්කරගෙන ඇත්තේ විදේශ ප්‍රතිපත්තියෙහි හා විදේශ  සම්බන්ධතාවල ය. බටහිර රටවල් සමග සම්බන්ධතා පවත්වාගෙන යන අතර ඔවුන් හමුවේ දණ නොනමා කටයුතු කිරීමටත් සාක් කලාපයේ රටවල් හා අසල්වැසි බෞද්ධ රටවල් සමග සුවිශේෂ සම්බන්ධතා පැවැත්වීමටත් මහින්ද රාජපක්ෂ මහතා පියවර ගෙන ඇත. එතුමා මියන්මාරයේ කරන ලද සංචාරයත් මියන්මාර් ජනාධිපතිතුමා මෙරට කරන ලද සංචාරයත් විජාතික බලවේගවල සතුටට හේතු නො වී ය. මියන්මාරයේ ජනාධිපතිතුමාට විරුද්ධව ඊනියා මානව හිතවාදී පුස්සන් පිකට්ටුවක් පැවැත්වීමෙන් පෙන්නුම් කරන්නේ බටහිර හා මෙරට බටහිරින් වැටුප් ලබන විජාතික බලවේග කෙතරම් කැළඹීමට පත් වී ඇත් ද යන්න ය. මානව හිමිකම් යනුවෙන් අද ඇත්තේ බටහිර නූතනත්වය රැකීමට ඇති මානව හිමිකම් ය යන්න ජාතික මතවාදය වෙයි.

එහෙත් මහින්ද රාජපක්ෂ මහතා සියළු තැන්හි ජාතික මතවාද අනුගමනය කරන බව මෙයින් නො කියැවෙයි. ආර්ථික ප්‍රතිපත්තිය දේශීය නිෂ්පාදන වර්ධනය කිරීම පැත්තට යොමු වී ඇත. ඒ සුභදායක ය. එහෙත් පොදුවේ ආර්ථිකය, අධ්‍යාපනය, සංවර්ධනය ආදී ක්ෂෙත්‍රවල තවමත් ජාතික මතවාද ක්‍රියාත්මක නො වේ. එයට වරදකරුවා මහින්ද රාජපක්ෂ මහතා නො වේ. ජාතික බුද්ධිමතුන් තවමත් සිය කාර්යභාරය නිසි අයුරින් ඉටුකර ඒ ඒ ක්ෂෙත්‍රවල ජාතික මතවාද ගොඩනගා නැත. ජාතික මතවාද නැති තැන ඒ ක්‍රියාත්මක කළහැකි නො වේ.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva